25 YEARS 1996 - 2021
CENTRE FOR POLICY ALTERNATIVES

**ත්‍රස්ත විරෝධී නීතිය: කුරිරු වූ උරුමයක්**

නව ත්‍රස්ත විරෝධී පනත් කෙටුම්පත අධිකරණ අමාත්‍යවරයා විසින් පසුගියදා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද අතර, එහි පළමු වර කියවීම 2024 ජනවාරි 10 වැනි දින සිදු කරන ලදී.  පනත කෙටුම්පත් කිරීම ප්‍රශ්නකාරී වන තත්වයක් තුළ ඒ හා සම්බන්ධ සුවිශේෂී ගැටළු ද්විත්වයක් මහජනතාව, සුළු  ජන කොටස්, සහ රජයට එරෙහි විරුද්ධ මත දරන්නන්ගේ නිදහස සම්බන්ධව බලපෑම් කරමින් තිබේ.

වසර 2018 දී 'ප්‍රති-ත්‍රස්ත පනතට අදාළ මූලික කෙටුම්පත' රජය විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නට යෙදිනි. මෙම පනත් කෙටුම්පත ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ අභියෝගයට ලක් වූ අවස්ථාවේ දී එහි ඇතැම් කොටස්වලට ශ්‍රේෂ්ඨාධිකරණ අවසරය හිමි වූ නමුත් රජය තවදුරටත් පනත් කෙටුම්පත ඉදිරියට ගෙන යාමෙන් වැළකී සිටින්නට විය. පසුව, 2023 මාර්තු මස දී, නව පනත් කෙටුම්පතක් ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කළ අතර එවර එය 'ත්‍රස්ත විරෝධී පනත් කෙටුම්පත ලෙස නම් කරනු ලැබූ අතර එහි ස්වරූපය අතින් මීට  පෙර හඳුන්වා දී තිබූ ප්‍රති-ත්‍රස්ත පනත් කෙටුම්පත හා සමාන වූ නමුත් හරයාත්මකව ගත්කල ඇතැම් අංශයන්ගෙන් වඩාත් කුරිරු බලපෑම් ඇති කළ හැක්කක් විය. මෙම පනත් කෙටුම්පතට එරෙහි විවේචන ප්‍රබල සහ පුළුල්ව පැතිර ගිය අතර, සිවිල් සමාජයේ බොහෝ කොටස් මෙම පනත් කෙටුම්පත සම්බන්ධයෙන් තම කනස්සල්ල පළ කිරීම සඳහා ඒකරාශී විය. ඊට ප්‍රතිචාර වශයෙන් රජය පනත් කෙටුම්පත ඉල්ලා අස්කර ගන්නා බව නිවේදනය කළ අතර, සංශෝධන සඳහා යෝජනා ඉල්ලා සිටින ලදී. ඉන්පසුව, පනත් කෙටුම්පතේ නව අනුවාදයක් 2023 සැප්තැම්බර් 15 වන දින ප්‍රකාශයට පත් කරන ලද අතර මහජන අදහස් කැඳවනු ලැබූව ද, ත්‍රස්ත විරෝධී පනත් කෙටුම්පතෙහි නව අනුවාදය බොහෝ ආකාරවලින් එහි පූර්ව කෙටුම්පතට සමාන විය. අනතුරුව පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ න්‍යාය පුස්ථකයට ඇතුළත් කල ද එය කිසි දිනෙක පාර්ලිමේන්තුවට ඉදිරිපත්කරනු නොලැබිණි. 2023 ඔක්තෝම්බර් 18 වන දින කථානායකවරයා විසින් පනත් කෙටුම්පත නැවත වරක් ඉල්ලා අස්කර ගත් බව නිවේදනය කළේය.

මේ වනවිට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇති පනත් කෙටුම්පත2023 සැප්තැම්බර් මස ඉදිරිපත් කරන ලද ත්‍රස්ත විරෝධී පනත් කෙටුම්පතේ සමාන අනුවාදයම බව දක්නට ලැබෙන්නකි. පනත් කෙටුම්පතේ අනුවාද විවිධ අවස්ථාවලදී ඉදිරිපත් කිරීම සහ ඉල්ලා අස්කර ගැනීමත් සමඟ ව්‍යවස්ථාදායක ක්‍රියාවලිය තුළ බොහෝ පියවරයන් ගැනීම සිදු වී ඇතත්, නීති සම්පාදන ක්‍රියාවලියේ ඉතා වැදගත්ම පාර්ශ්වකරුවන් වන මහජනතාවගේ අදහස් විමසීම සහ සලකා බැලීම යන සුවිශේෂී අංගය මුළුමනින්ම නොසලකා හැර තිබේ. බොහෝ විට ශ්‍රී ලංකාවේ නීති කෙටුම්පත්කරණය සම්බන්ධයෙන් ගත් කල, ත්‍රස්ත විරෝධී පනත කෙටුම්පත් කිරීමත් සමඟ

මහජන මතය විමසා බැලීම යන්න බොහෝ දුරට හාස්‍යයක් වී ඇති අතර, මෙහි ප්‍රතිඵලයක් ලෙස රටේ ජනතාවගේ අවශ්‍යතා නියෝජනය නොකරන නීතියක් නිර්මාණය වීම වැඩි වශයෙන් දක්නට ලැබෙන්නකි.

ශ්‍රී ලංකාවේ පවතින ප්‍රවණතාවන්ට අනුවම යමින්, ත්‍රස්ත විරෝධී පනත කෙටුම්පත් කිරීම කඩතුරාවන්ට වසන්ව සිදු කර ඇති අතර, පනත් කෙටුම්පතට එරෙහි හඬ නැඟීම් තිබියදීත්, එය නීතියක් බවට සම්මත වුවහොත් තම අයිතිවාසිකම් සීමා විය හැකි බවට පවා දැනුවත්ව සිටින්නේ ශ්‍රී ලාංකිකයන් අතුරින් සුළුතරයක් පමණි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් 2023 නොවැම්බර් මස පවත්වන ලද මත විමසුමකට අනුව යෝජිත ත්‍රස්ත විරෝධී පනත් කෙටුම්පත පිළිබඳව ශ්‍රී ලාංකික ජනතාවගෙන් 38.5% ක් පමණක් දැනුවත්ව සිටි බවත්, මෙම සංඛ්‍යාවෙන් 72.6% ක් බලයේ සිටින කණ්ඩායම් විසින් තම වාසිය සඳහා පනත අවභාවිත කරනු ඇතැයි සඳහන් කරමින් පනත් කෙටුම්පත අනුමත නොකරන බවත් හෙළිදරව් විය.

ඵලදායී ත්‍රස්ත-විරෝධී ප්‍රයත්නයන් ත්‍රස්තවාදයෙහි මූල බීජයන් කෙරෙහි මෙන්ම එවැනි හැසිරීම් වලට මිනිසුන් පොලඹවන්නේ කුමක් විසින් ද යන්න පිලිබඳ අවධානය යොමු කළ යුතුය. කෙසේ වෙතත්, ත්‍රස්ත විරෝධී පනත් කෙටුම්පත බොහෝ අවස්ථාවන් හී දී එහි පූර්වගාමියා ලෙස දශක ගණනාවක් මුළුල්ලේ සුළු ජාතික ප්‍රජාව, මාධ්‍යවේදීන්, මානව හිමිකම් ආරක්ෂා කරන්නන් පමණක් නොව වැරදි මොහොතක වැරදි ස්ථානයක සිටි සාමාන්‍ය පුරවැසියන් පවා මර්දනය කිරීමට උපයෝගී කරගත් රාජ්‍ය අනුග්‍රාහක ත්‍රස්තවාදයේ මෙවලමක් වූ කුරිරු ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත සම්බන්ධ අඩිපාරේ ගමන් කිරීමට කටයුතු කොට තිබේ. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත හා බැඳුනු  මෙම අඳුරු උරුමය සහ අපගේ ව්‍යවස්ථාපිත නීතියේ කොටසක් ලෙස එය අඛණ්ඩව පවත්වාගෙන යාමට ඇති පුළුල් විරෝධය නව නීතියක් කෙටුම්පත් කිරීමේදී සලකා බැලිය යුතුව තිබුණි.

මෙම නීතිය එනයින්ම බරපතල ත්‍රස්තවාදී ක්‍රියා පාලනය කිරීමෙන් ඔබ්බට යන අරමුණු උදෙසා භාවිතා කිරීම පිණිස විවෘත වන්නකි. 2023 මාර්තු මස දී ත්‍රස්ත විරෝධී පනත් කෙටුම්පත ප්‍රථම වරට ප්‍රකාශයට පත් කරන ලද කාලය සහ පනත් කෙටුම්පතේ අඩංගු ත්‍රස්තවාදී වරද පිළිබඳ පුළුල් හා නොපැහැදිලි නිර්වචන සලකා බලන විට, එය නිසැකවම රජයට එරෙහිව මතු විය හැකි විරෝධතා මැඩපැවැත්වීමේ මෙවලමක් ලෙස භාවිතා කිරීමට අදහස් කරන්නක් බව පෙනී යන්නකි. ඒ අනුව, ඇඳිරි නීතිය පැනවීමට, සංවිධානවලට එරෙහිව තහනම් නියෝග නිකුත් කිරීමට සහ ඕනෑම රාජ්‍ය හෝ පෞද්ගලික ස්ථානයක් වෙත ජනතාවට ප්‍රවේශ වීම සීමා කරන වැළැක්වීමේ නියෝග පවා නිකුත් කිරීමට ජනාධිපතිවරයාට එමඟින් පුළුල් බලතල ලබාදී ඇත. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ මේවනවිට දක්නට ලැබෙන ගැටළු, එනම්, මූලික වශයෙන් පවතින විධායක බලය මත දීර්ඝ කාලයක් රඳවා තබා ගැනීමේ ගැටළුව ද මෙම නව නීති කෙටුම්පතෙහි කොටසක් ලෙස අන්තර්ගත කොට ඇත.

ත්‍රස්ත විරෝධී පනත් කෙටුම්පත සම්පාදනය කිරීමේ ක්‍රියාවලිය සහ එහි අන්තර්ගතය යන දෙකෙන්ම පැහැදිලි වන්නේ මෙය රජය ආරක්ෂා කිරීම අරමුණු කරගත්, නමුත් ජනතාවගේ සැබෑ අවශ්‍යතා සඳහා කිසිදු සැළකිල්ලක් නොදක්වන ස්වයං-සේවා නීති සම්පාදනයක් බවයි. එහෙයින් යම් හෙයකින් එය සම්මත වුවහොත් තවත් දශක ගණනාවක් ඇදී යන මර්දනයකට, වධහිංසාවට සහ අපයෝජනයන්ට රටම ගොදුරු කරන තත්වයකට එය හේතුවනු ඇත.